## 232 ඔබේ දයා සෙනේ

ඔබේ දයා සෙනේ කියා සඳු පායනවා
ඔබේ සදා මහිමෙ කියා හිරු පායනවා
ඔබෙ කරුණා ගුණය කියා පොද වැසි හැලෙනා
ඔබේ සිසිල් සෙවන ගෙනා දහමේ සොබනා

සසර සරණ දුගී පවස ඔබ නිවන්නෙද
සත අසරණ විඩා ගිමන ඔබ නිවන්නෙද
කඳුළු දවන දෙනෙත සඳුන් ඔබ නොවන්නෙද
සුහද දහම් අමා සිසිල ඔබ නොවන්නෙද

මල් ගොමු පිරිවරා බඹරු ඔබ ගී ගයනා
ගල්පර සෝදා සාගර රැළි කව් කියනා
තුරු අතරින් ගලා ළහිරු ලොව නලියවනා
සොබා සිරිය දෙව් වත පෑ කැටපත් කෙරුනා